යම් කිසි පුවතක් වාර්තා කිරීමේදී එම පුවතට සෘජුවම සම්බන්ධ වන අනෙක් පාර්ශව සම්බන්ධ කර ගනිමින්, ඔවුනට පවසන්නට ඇති දෙයද පුවතට ඇතුළත් කිරීම ඔස්සේ වඩාත් සමබර වාර්තාකරණයක් ඉදිරිපත් කිරීමට හැකියාව ලැබෙනු ඇත. එනිසාම වගකීම් සහගත මාධ්‍යකරණය වන්නේ, පුවතට අදාළ අනෙකුත් පාර්ශව සම්බන්ධ කොට ගෙන ඔවුන්ට පැවසීමට ඇති අදහස් ද දැනගැනීම හෝ අඩු තරමින් අනෙකුත් පාර්ශව සම්බන්ධ කරගැනීමට සාධාරණ උත්සාහයක් දැරීමයි. කෙසේ වෙතත් සෑම ජනමාධ්‍යයක්ම මෙය ප්‍රායෝගිකව පිළිපදින්නේද යන්න පැනයකි.
ඊට උදාහරණයක් ලෙසින් දැක්විය හැකි වන්නේ, පසුගිය දින ගණනාව පුරාම මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජික මහාචාර්ය රත්නජීවන් හූල් සම්බන්ධයෙන් චෝදනා එල්ල කරමින් පළ වන පුවත් ප්‍රමාණයයි.

මෙහිදී මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජික රත්නජීවන් හූල් සහ නිරෝධායනයේ සිටි ඔහුගේ දියණිය නිරෝධායන නීති කඩමින් මැතිවරණ කොමිෂන් සභා කාර්යාලයට පැමිණුනේය යන්නත්, හූල් හට දින 14 ක නිරෝධායන කාලයකින් පසුව පැමිණෙන ලෙසින් කොමිෂන් සභාවේ සභාපති විසින් පැවසූවේ යැයි කියන තොරතුරු හා ඇතැම් විට හූල් හට එල්ල වූ දෝෂාරෝපණයන් මෙම පුවත් වාර්තාවන්හි අන්තර්ගත විණි. මැයි 21 වන දිනට පෙරාතුව එළිදැක්වුණු මෙම පුවත් වාර්තාවන් හා විකාශයන් අතුරින්, හිරු ටීවී හැරෙන්නට අනෙක් මාධ්‍ය එකක් හෝ රත්නජීවන් හූල්ගේ පාර්ශවයෙන් කරුණු විමසා බලා සඳහන් කොට නොතිබුණි. හිරු ටීවී පුවත් මගින් හූල් වෙත චෝදනා එල්ල කරන අතරතුරදී ඔහුව සම්බන්ධ කොට ගෙන ඔහුගේ පාර්ශවයේ කරුණු දැක්වීම්ද සඳහන් කොට, අනතුරුව හූල් සම්බන්ධව තවත් චෝදනා යොමු කරන්නට යෙදිණි.

මැයි 21 වන දින රත්නජීවන් හූල් විසින් කලම්බු ටෙලිග්‍රාෆ් ඔස්සේ ලිපියක් පළ කරමින්, මෙම සිදුවීම් සම්බන්ධයෙන් ඔහුගේ පාර්ශවයෙන් දැක්වීමට ඇති තොරතුරු ඉදිරිපත් කරන්නට යෙදිණි. නමුත් මැයි 21 වන දිනෙන් පසු මේ සම්බන්ධයෙන් පළවූ වාර්තාවන්හි රත්නජීවන් හූල්ගේ එම ප්‍රකාශය සඳහන් කොට තිබුණේ දි අයිලන්ඩ් පුවත්පත පමණි. සිදුවීම සම්බන්ධ වාර්තා පළ කළ අනෙකුත් කිසිදු මාධ්‍යයක් මගින් රත්නජීවන් හූල්ගේ ප්‍රකාශය සඳහන් කිරීමක් හෝ රත්නජීවන් හූල්ව සම්බන්ධ කරගනිමින් ඔහුගේ පාර්ශවයේ අදහස් විමසීමක් සිදුකර නොතිබුණි.

එසේ බලන කළ, ඉහත සිදුවීම සම්බන්ධයෙන් පුවත් සහ ලිපි ඉදිරිපත් කළ මාධ්‍යයන්ගෙන් අතිබහුතරයක් සිදුකර ඇත්තේ ඒකපාර්ශවික වාර්තාකරණයක් නොවේද? එවන් වාර්තාකරණයක් නිරවද්‍යදැයි, නොමඟ යවන සුළු නොවේදැයි පාඨක හා ප්‍රේක්ෂක අපට ප්‍රශ්න කරන්නට නොසිදුවේද? මේ වගකීම් සහගත ජනමාධ්‍යකරණයද?

කලම්බු ටෙලිග්‍රාෆ් හි පළවූ මහාචාර්ය හූල්ගේ
ලිපිය: [https://www.colombotelegraph.com/index.php/elilini-hoole-defamation-by-several-news-outlets/](https://www.colombotelegraph.com/index.php/elilini-hoole-defamation-by-several-news-outlets/)

**#MediaethicsSL #Sinhalapress #Englishpress #lka #Divaina #Mawbima #Aruna #Lankadeepa #DailyMirror #TheIsland #CeylonToday #TV #HiruTV #TVDerana**